Embassy of the United States of America
Colombo

# මාධ්‍ය නිවේදනය

Public Affairs Section
Tel: +94 (1) 249-8100 ● Fax: +94 (1) 244-9070
Email: vanhornnt@state.gov ● http://lk.usembassy.gov

Release No. 20170918

## එක්සත් ජනපදය සහ ශ්‍රී ලංකාව සම අනුග්‍රහයෙන් මානුෂීය සහාය සහ ආපදා සහන සැලසීමේ අරමුණින් පැසිෆික් එයාර් ලිෆ්ට් රැළිය පවත්වනු ලබයි

**සැප්තැම්බර් 18 කොළඹදීය** එක්සත් ජනපදය සහ ශ්‍රී ලංකාව වසරකට දෙවතාවක් සිදුකරන අභ්‍යාසයක් වන පැසිෆික් එයාර් ලිෆ්ට් රැළිය 2017 සැප්තැම්බර් 11 සිට 15 දක්වා පවත්වනු ලැබිණි. පැසිෆික් එයාර් ලිෆ්ට් රැළියට එක්සත් ජනපදය ශ්‍රී ලංකාව සහ අනෙකුත් ඉන්දු පැසිෆික් කළාපයේ රටවල් සහභාගී වූහ. මෙම අභ්‍යාසයේදී මානුෂීය සහාය සැලසීම සහ ආපදා සහන මෙහෙයුම් පිළිබඳව අවධාරණය කරනු ලැබිණි. සහභාගිකයින් මෙහිදී මෙහෙයුම් සැළසුම් කිරීම, භාණ්ඩ මෙහෙයවීම සහ පැටවීම සහ ගුවනේ-ගොඩබිම සහ ගුවනින් භාණ්ඩ හෙළීමේ මෙහෙයුම් පිළිබඳව ප්‍රායෝගික පුහුණුවක් ලබාගත්හ.

ලෝක ජනගහනයෙන් 60 ක් ඉන්දු ආසියා, පැසිෆික් කළාපයේ වාසය කරනු ලබන අතර ඔවුන් ජාතීන් 36 කට අයත් වේ. මෙම රටවල් ලෝකයේ සමස්ථ භූමි ප්‍රදේශයෙන් 53% ක් ආවරණය කරනු ලබයි. ලෝකයේ ස්වභාවික ආපදාවලින් වැඩි ප්‍රමාණයක් සිදුවන්නේ මෙම ප්‍රදේශයේය. ස්වභාවික ආපදාවන්හිදී ජනතාවට වඩාත් ඵලදායී ආකාරයට ආපදා සහන සැලසීම සඳහා රටවල් සහයෝගයෙන් ක්‍රියාකිරීම සහ ඒකාබද්ධ ධාරිතාවන් වැඩිදියුණු කරගැනීම ඉතා වැදගත් වන බව අත්දැකීම් මගින් පෙනීගොස් ඇත.

මෙම අභ්‍යාසයේ එක් කොටසක් වන ගුවන්යානා පුහුණුව සඳහා මිසිසිපි හි කීස්ලර් ගුවන් හමුදා කඳවුරේ 815 වැනි ස්කොඩ්රන් බලකායේ C 130 J හර්කියුලිස් යානාවක්, අර්කන්සාස් හි ලිට්ල් රොක් ගුවන් හමුදා කඳවුරේ 327 ස්කොඩ්රන් ගුවන් බලකායේ C 130 J වර්ගයේ ගුවන් යානාවක් හා ශ්‍රී ලංකාවේ සහ ඕස්ට්‍රේලියාවේ ගුවන් යානාවන් එක්වූහ. මානුෂීය සේවාවන් සැලයීමේ මෙහෙයුම් වලදී ගුවන් මගින් මුදාගැනීමේ කටයුතු හා සම්බන්ධ තාක්ෂණික ක්‍රම පිළිබඳව මෙහිදී ඔවුන් ප්‍රායෝගික පුහුණුවක් ලැබූහ

ශ්‍රී ලංකාව 2011 වසරේ අගෝස්තු මාසයේදී ද පැසිෆික් එයාර් ලිෆ්ට් රැළියට සමඅනුග්‍රහය දැක්වූ අතර මෙහිදී අවධානය යොමුකරනු ලැබූයේ සර්ම කළාපීය සුළිසුලං තත්වයක් පිළිබඳවය.